අවදියෙන් ඉන්න අවදානමක මතකයක් **මේ මගේ නවාතැනයි**




**අතුල කල්දෙමුල්ල** ලබන කලාපයේ සිට කොටස් ලෙසින් ලියන සත්‍යයට ලංවූ මනඃකල්පිතයක්

# විශ්ව රංගායතනය
## රංගනයේ නව මං සොයා



**අද ලෝකයේ නර්තනය විවිධ හැඩතල වලින් දැකිය හැකියි. ශ්‍රී ලංකාවේ නර්තනයේ හැඩතල කෙබඳුද?**

සිංහල නර්තනය ප්‍රධාන වශයෙන් සම්ප්‍රදා 3 කින් යුක්තයි. උඩරට පහතරට හා සබරගමු වශයෙන්. ද්‍රවිඩ ජනතාව අතර ප්‍රචලිත භරත නාට්‍යම් නර්තනාංග වෙනම නර්තනාංගයක් ලෙස දකින්න පුලුවන්. සිංහල නර්තනයේ ප්‍රධාන සම්ප්‍රදායන් 3 වෙන්කොට දැක්වීමේ දී මේ සඳහා භාවිතා කරන බෙර වර්ග උඩරට නැටුම් සඳහා ගැට බරයත් පහතරට නැටුම් සඳහා දොවොල් බෙරයත් සබරගමු නැටුම් සඳහා දවුලත් යොදා ගැනීම කරනවා. එමෙන්ම මේ සඳහා යොදා ගන්නා පද ආදියත් දෑත් ඉරියව් ආදියත් එකිනෙකට වෙනස්කම් දක්වනවා.

**උඩරට නර්තනය හැදෑරීමේදී ශිල්පීය තත්වයට පැමිණීමට නර්තනය කෙතරම් කාලයක් හැදෑරිය යුතුද?**

උඩරට නර්තනයට පිවිසෙන දරුවා ප්‍රථමව පා සරඹ අත් සරඹ පුහුණුව ලැබ ඉන් පසුව වන්නම් පද කස්තිරම් අඩව් වට්ටම් ආදිය පුහුණුව ලබනව. ඉන් අනතුරුව කොහොඹා කංකාරියේ අඩංගු සියලුම ශාස්ත්‍රීය පද කොටස් පුහුණුව ලැබිය යුතුයි. දුනුමාලප්පුව ආවැන්දුම කෝල්පාඩුව දුස්නය හත්පද නැටීම සියල්ල මේවාට ඇතුළත් වෙනවා. මේ සියල්ල හැදෑරීමට අඩුම තරමේ වසර 7 - 10 අතර කාලයක් ගතවෙනවා.

**උඩරට නර්තනයේදී වෙස් තැබීම යනු කුමක්ද?**

හිසවෙස් තැබීම සිදුකරන්නේ පිරිමි දරුවන් උදෙසායි. පිරිමි දරුවකු නර්තනය හදාරා කෙතරම් දක්ෂ අයෙකු වූවත් වෙස් තැබීමේ මංගල්‍යයකින් තොරව වෙස් තට්ටුව හිසෙහි පැළඳ නැටීම කරන්නේ නැහැ. වෙස් තට්ටුව හිස පැළඳවීම සඳහා වතාවත් රාශියක් සිදුකළ යුතුයි. ඒ සියල්ල නිසියාකාරව සිදුකළ පසුව වෙස් පැළඳවීම සිදුකරනවා. ඉන්පසුව වෙස් ඇඳුම ඇඳ



නැටීමට ඔහු සුදුසුකස් ලබනවා. මෙය රජෙකුට ඔටුනු පැළඳවීම හා සමයි. අපේ සම්ප්‍රදායික වෙස් ඇඳුම එදා විජය රජුගෙන් පසුව රජ පැමිණි පඬුවස්දෙව් රජුගේ චිවිදොස් සිවුකිරීමට මලය රට සිට පැමිණි මලය රජුන්ගේ ඇඳුමෙන් හරි අඩක් ලෙස සැළකෙනවා.

**පිරිමි දරුවන්ට මෙන්ම ගැහැනු දරුවන්ටත් මේ වෙස් තැබීම සිදු කරනවාද?**

ගැහැනු ළමුන් සඳහා සම්පූර්ණ වෙස් තට්ටුව හිස පැළඳවීම සිදු කරන්නේ නැහැ. මෙහිදී පිරිමි ශීර්ෂාභරණයේ කොටසක් වන පාහිම්පත හිසට පැළඳවීමයි සිදු කරන්නේ. ඉන්පසු ඔවුන්ගේ දක්ෂතා එදින පැමිණ සිටින පිරිසට ඉදිරිපත් කරන අතරම නර්තන ප්‍රසංගයේදී දක්තා දැකබලා ගැනීමට සැළැස්වීම සිදුකරනවා.

**විශ්ව රංගායතනයේ ශිල්පිනියන් සය දෙනකු මේ කර්තව්‍යය සිදුකිරීමට නියමිතයි නේද?**

ඔව්. අගොස්තු 14 වන ඉරු දින උදෑසන 8 සිට මෙම උත්සවය මෙල්බන් වාසී සැමට දැක බලා ගැනීමට හැකියාව ලැබෙනවා. කීස්බරෝ ධම්මසරණ විහාර භූමියේදී මෙම ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍යය සිදුකරනවා. මේ සඳහා එදින උදෑසන පැමිණ කිරිබත් කටක් කා අපේ දරුවන්ට ආශිර්වාද කරන්නැයි අපි සැමට විවෘතව ආරාධනා කරනවා.

**ඉන් අනතුරුව පැවැත්වෙන ප්‍රසංගය ගැන සඳහන් කළොත්**

විශ්ව රංගායතනයේ ප්‍රසංගය සෑම වසර දෙකකටම වරක් ඉදිරිපත් කළත් මෙවර ප්‍රසංගය සිදුකරන්නේ වසර තුනකට පසුවයි. මෙවර ශීර්ෂාභරණ මංගල්‍යයට සහභාගි වන ශිල්පිණියන් සය දෙනා ප්‍රධාන කොටගන මෙම ප්‍රසංගය සංවිදානය කොට තිබෙනවා. මෙහිදී මේ සය දෙනාට අමතරව විහ්ව රංගායතකනයේ ඉගෙනුම ලබන අනෙකුත් දරුවන්ද නර්තනයට දායක වෙනවා.



සැප්තැම්බර් මස 4 වන ඉරුදින සවස 6 ට බර්වුඩ් බෙසන් සෙන්ටර් හිදී " නර්තනාභිෂේක" ප්‍රසංගයෙන් මොවුන් ඔබ හමුවේ ශිල්ප දක්වාවි. ඉතා අඩු මිලකට අලෙවිවන ටිකට්පත් මිලදී ගෙන අපේම දරුවන්ට දිරියක් වන්නෙයි මා මෙල්බන් වාසී සියලුම කලා ලැදි හිතවතුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**මෙහි ඇතුළත් වන නර්තනාංග පිළිබඳව සඳහන් කළොත්**

ගියවර ප්‍රසංගයෙදි මා නවීන නර්තනයට මුල්තැන දී කටයුතු කළා. මෙවර ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික නර්තනයට මුල් තැන දී සංවිදානය කර තිබෙනවා. නමුත් ඉගාමත් වින්දනීය ප්‍රසංගයක් ප්‍රේක්ෂකයනට දැකබලා ගැනීමට රස විඳීමට හැකි වන බව මගේ විශ්වාසයයි.

**මෙල්බන් වැනි නගරයක මෙවැනි සම්ප්‍රදායික දේ සිදුකිරීමට තරමක් අපහසුයි නේද? ඔබ එයට මුහුණ දෙන්නේ කෙසේද?**

ඉතා කාර්යබහුල ජීවිත ගත කරන අපට මෙවන් දේවලට කාලය සොයාගැනීම ඉතා අසීරුයි. විශ්ව රංගායතනය තුළ එදා මෙදා තුර ශිල්ප හැදෑරූ දැරියන් විශාල ගණනක් සිටිනවා. නමුත් පාහින්පත් තැබීමකට යොමුවුණේ ඉන් සය දෙනකු පමණයි. මොවුන් නර්තනය පිලිබඳ විශේෂ ආදරයක් තිබෙන අය හැටියට මම දකිනවා.

එසේම මේ ශිල්පිණියන්ගේ දෙමාපියන්ද මෙවන් දෙයක වටිනාකම ඉතා හොඳින් හඳුනාගෙන සිටිනවා. ඒ වගේම මවෙන් දෙයකට යොමු වීමට දරුවකු තුළ වාසනා ගුණයක් පිහිටිය යුතුයි. මෙවන් දේ වලට සිත් දීමට ඒ වෙනුවෙන් මාස ගණනක් කැපවීමට නිර්මාංශව සිටීමට මෙන්ම මොවුන් මේ සඳහා තම වටිනා කාලය කැපකරගෙන සිදුකරන පුහුණුවීම් දෙස බැලූවිට ඔවුන්ගේ කැපවීම ආසාව අපේ කලාවට දක්වන ලැදියාව කෙතරම්දැයි සිතෙනවා. අඩුම තරමේ මේ වසර 14 පුරාවටම විශ්ව රංගායතනය තුළින් මෙවන් ශිල්පීන් සය දෙනකු හෝ බිහි කිරීමට ලැබීම මා ලද ජයග්‍රහණයක් සේ සළකනවා. විශ්ව රංගායතනයේ දරුවන් මෙන්ම දෙමාපියන්ද සියලුම දෙනාගෙන් ලැබෙන සහබෝගය ඉතාමත් අගය කොට සැළකිය යුතුයි. මොවුන් ශ්‍රී ලාංකීය සම්ප්‍රදායට ගරු කරන තම දරුවන්ද එයට යොමු කිරීමට නිරතුරුව කැපවන පිරිසක්.

සාකච්ඡා කළේ

**මංජුලා පෙරේරා**